Prepared by- ඩයනා පුෂ්පරාණී මිය

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

පළමු වාරය

## 4.0 නිර්දේශිත ගායනවල සමාජසංස්කෘතික පසුබිම

### 4.1 වෛරොඩි වන්නම (උඩරට නර්තන සම්ප්‍රදායය)

උඩරට සම්ප්‍රදායයට අයත් වන්නම් අතර මාත්‍රා 3 තාල රූපයට වෛරොඩි වන්නම ගායනය කෙරේ. වන්නමේ කවි ගායනයෙන් කෙහෙතු විමානය පිළිබඳව කෙහෙතු හා ඊශ්වර දෙවියන් අතර පැවති සංවාදය මැණිකකට උපමා කොට ඇත.

වන්නම් තානම මඟින් ගායන නාදමාලාව හඳුනා ගත හැකි වන අතර කවිය මඟින් වන්නම් ප්‍රස්තුතය විස්තර වේ. ගායනය ආරම්භයේ දී අවග්‍රහයෙන් ගායනා කිරීම මෙම වන්නමේ සුවිශේෂ ලක්ෂණයකි. (22 පිටුවේ වෛරෝඩි වන්නම අදාළ කර ගන්න.)

වෛරොඩි වන්නමේ නාදමාලාව නිශ්චිතව හඳුනා ගෙන මාත්‍රා 3 තාල රූපයට ගායනය කළ යුතු ය.

**ඊශ්වර කුණ්ඩතාලය සින්දු වන්නම (පහතරට නර්තන සම්ප්‍රදායය)**

විෂ්ණු දෙවියන්ගේ ගුණ වර්ණනා කිරීම සඳහා මෙම සින්දු වන්නම ද රචනා වී ඇති අතර මාත්‍රා 3 තනි තිත අනුව ගායනා කරනු ලැබේ.

* 23වන පිටුවේ ඊශ්වරකුණ්ඩ තාලය සින්දු වන්නම අදාළ කර ගන්න.

**කදම්හ පක්ෂි වන්නම (සබරගමු නර්තන සම්ප්‍රදායය)**

කදම්බ පක්ෂි වන්නමෙන් වළිකුකුළකු ගේ ගති ලක්ෂණ පිළිබඳ ව කියවේ. එහි වචනාර්ථය ගත්කල වළිකුකුලාගේ විචිත්‍ර බව හා හැසිරීම් රටාව පිළිබඳ තොරතුරු සමූහයක් කියවේ.

මාත්‍රා 3 තනි තිත අනුව " ජිං ගතත් ගතත් ගත කුද ජිංත ජිං තරිකිට ජිං තරිකිට තකට" යන දවුල් පදයට අනුකූලව වන්නම ගායනය කරනු ලැබේ. ගායන රටාවට වඩාත් උචිත වන පරිදි බෙර පදය සකස් වී තිබීම මෙහි ඇති සුවිශේෂ ලක්ෂණයකි. වන්නම් ගායනය කිරීමේ දී අවග්‍රහයෙන් ගායනය කිරීම සුදුසු ය. ඉතා ම ලයාන්විත නාදමාලාවකින් සමන්විත මෙම වන්නම ගායනය කළ යුත්තේ විලම්බ ලයකිනි.

## සිරස පාද කවි

ආතුරයාගේ හිසේ සිට පාදාන්තය තෙක් වැලඳී ඇති සියලු දොස් දුරු කර සෙත් ශාන්තිය ළඟා කරදීම සඳහා ගායනය කරනු ලබන කවි විශේෂය සිරස පාද කවි ලෙස හැඳින්වේ. උඩරට, පහතරට, සබරගමු යන සම්ප්‍රදායයන් ත්‍රිත්වයෙහි ම ශාන්තිකර්මවල සිරස පාද කවි ගායනය කරන අතර, එක් එක් සම්ප්‍රදායට අනුව නාදමාලාවල වෙනස්කම් දක්නට ලැබේ. එම වෙනස්කම් හඳුනා ගෙන ඒ හා අදාළ කවි ගායනය කළ යුතු ය.

**තාල රූපය : මාත්‍රා 3 තාලය (මැදුම් තනිතිත)**

සොළසා සංඛය පළමු ව පෙරුම් පිරූ බලයෙන්දා
මෙලෙස මුනිඳු වජ්‍රාසන වැඩහිඳ කෙලෙසුන් බින්දා
කලස රැගෙන මිහිකත දෙස් කී අනුහස් බලයෙන්දා
සිරස නළල පැමිණි දෝස දුරලන් මුනි බලයෙන්දා

### සවරං කවි ගායනා

දේශීය ගැමි නැටුම් අතර සවරං නැටුම ඉතා අලංකාර වූ ගැමි නැටුමකි. සවරං ලී දෙක දෑතින් ගෙන කරකවමින් නර්තනයේ යෙදෙන අතර මේ නැටුමේදී ගායනය කරනු ලබන කවි විශේෂය සවරං කවි ලෙස හැඳින්වේ.

සවරං නැටුමේ ගායනවල අන්තර්ගතයේ ගැමි ඇදහිලි හා විශ්වාස පිළිබඳ ව සඳහන් වී ඇත. නර්තනය කිරීමට පෙර සියලු දෙවියන්ගෙන් අවසර ලබා ගැනීම අනෙකුත් ගැමි ගායනවල මෙන් ම සවරං කවිවල ද දක්නට ලැබේ. විනෝදාස්වාදය සඳහා නිර්මාණය වූ මෙම ගැමි නැටුමේ ද යෙදෙන කාන්තාවන්ගේ ලාලිත්‍යය, ඔවුන් නැටුමට සැරසෙන ආකාරය ද එම ගායනවල අන්තර්ගත වී ඇත.

- සවරං කවි විවිධ තාල රූප අනුව ගායනා කළ හැකි ය.
- මෙම කවි විවිධ නාදමාලාවලින් යුක්ත ය.
- සවරං කවි ගායනයේ දී ඒකීය හඬ තලයක පිහිටා බෙර වාදනයට අනුව ගායනා කිරීමෙන් ගායන කුසලතාව වර්ධනය කර ගත හැකි ය.

දෑතට ගන්නේ සවරං පවන් සලන්නේ
සරඹ පාන්නේ පා පොඩි දෙක හසුරන්නේ
ගීත කියන්නේ සුමිහිරි තාල වයන්නේ
සබයට එන්නේ සවරං නැටුම් නටන්නේ

පැවරුම්

**1.**ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායන්ට අයත් වන්නමෙහි ගායනා මගින් කියවෙන්නේ කුමක් පිළිබඳවද ?

**2.**එම වන්නම් ගායනා කරන තිත් රූපය කුමක්ද ,

**3.**සිරස පාද කවි පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

**4.**සවරං නැටුම ඉදිරිපත් කරන අවස්ථා 3 ක් නම් කරන්න.